**කන්දකැටිය ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කන්දකැටිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කන්දකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ මිලදීගෙන තිබුණු පුස්තකාල පොත්වල වටිනාකම රු.151,360 ක් වුවද, එය රු.193,615 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතැති තොගයේ වටිනාකම රු.226,199 ක් වුවද, එය රු.38,509 ක් ලෙස මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී ඉදිකර තිබුණු දිවා සුරැකුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සඳහා දරන ලද වියදම රු.3,147,023 ක් වුවද, වර්ෂයේ දේපළ පිරියත හා උපකරණ එකතුකිරීම් යටතේ එම වටිනාකම රු.6,615,911 ක් වශයෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | | |
| | 218 රීතිය | සමාලෝචිත වර්ෂය සඳහා සියළු ඉඩම් හා ගොඩනැගිලි පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පරීක්ෂා කරවීමට කටයුතු කර නොතිබුණි. | රීති අනුව කටයුතු කිරීමට කාර්ය මණ්ඩලයට උපදෙස් ලබා දුන් බව. | වාර්ෂිකව ඉඩම් සමීක්ෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 1980 අංක 47 දරන පාරිසරික පනතේ 23(ආ) | නිකුත් කරන ලද අපද්‍රව්‍ය මෝචනයබැහැරලීම සඳහා / යක් බලපත්‍ර පාරිසරික ආරක්ෂණ ලබාගෙන නොතිබුණි. | පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කරන බව. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.805,328 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,193,235 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම<br>රු. | බිල්කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තු ගත ආදායම<br>රු. | බිල්කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
| (i) | වරිපනම් බදු | 3,008,740 | 3,415,531 | 2,791,518 | 624,013 | 2,948,740 | 3,949,667 | 2,412,220 | 1,537,447 |
| (ii) | කුලී | 3,968,520 | 5,164,316 | 3,294,130 | 1,870,186 | 3,949,200 | 3,545,799 | 2,479,231 | 1,066,568 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 594,600 | 905,760 | 905,760 | 0 | 595,000 | 498,990 | 498,990 | නැත |
| (iv) | වෙනත් ආදායම් | 7,206,380 | 6,684,265 | 5,634,092 | 1,050,173 | 1,969,550 | 3,797,650 | 4,526,474 | (728,824) |
| | **එකතුව** | 14,778,240 | 16,169,872 | 12,625,500 | 3,544,372 | 9,462,490 | 11,792,106 | 9,916,915 | 1,875,191 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.965,644 ක් හා මුද්දර ගාස්තු රු.57,265 ක් ගෙන්වා ගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ වලින් රු.27,265 ක් අය කරගෙන ඇති බව. | හිඟ හිටි උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 10 කට අධික කාලයක සිට පැවත එන වියදම් ණය හිමියෝ රු.2,451,570 ක් සහ වසර 05 කට අධික කාලයක සිට පැවත එන කර්මාන්ත ණය හිමියෝ රු.1,067,908 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ණය හිමි ශේෂ නිරවුල් කිරීම කළ යුතුය. |
| (ආ) | සභාව විසින් 2019 අගෝස්තු සිට 2020 නොවැම්බර් දක්වා වු කාලයට අදාළව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් සභා අරමුදලින් රු.87,784 ක අධිභාර මුදලක් ගෙවීමට සිදුව තිබුණි. | මෙම අධිභාර මුදල් සභා අරමුදලින් ගෙවිය හැකිද යන්න පළාත් පාලන කොමසාරිස්ගෙන් ලිඛිතව විමසීම් කර ඇති බව. | නියමිත පරිදි රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම සිදු කළ යුතුය. |

**3.2 මතබේදයට තුඩුදුන් ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත්ව තිබුණු කන්දකැටිය මංසන්ධියේ පර්චස් 12 ක ඉඩම තුළ පිහිටි කඩ කාමර 05 ක් ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙකු විසින් අනවසරයෙන් භුක්ති විඳින අතර, 1995 වර්ෂයේ දී සභාව එම අයට විරුද්ධව අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. එයින් ව්‍යාපාරිකයා ඉවත් කරන ලෙස අධිකරණයෙන් නියෝග ලබා දී තිබුණු අතර, ඒ අනුව ඔහුට 1996 වර්ෂයේදී සභාව විසින් කඩ කාමරයක අයිතිය දීමට තීරණය කර තිබුණි. එසේ වුවද අධිකරණ ක්‍රියාමාර්ග අනුව කටයුතු නොකර අදාළ පාර්ශවකරු සභාවට කිසිදු මුදලක් නොගෙවා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාද ව්‍යාපාරික කටයුතු කරමින් පැවතුනි. | මේ සම්බන්ධ සියලු ලිපිගොනු පළාත් පාලන දෙපාර්තුමේන්තුව වෙත ගෙන ගොස් ඇති බව. | අධිකරණ නියෝග අනුව කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ වාර්ෂිකව එක්රැස් වන කසළ ටොන් 25 කට ආසන්න ප්‍රමාණයක් දිරන සහ නොදිරන ලෙස වෙන් නොකර එක්රැස් කර බුද්ධංකෝට්ටෙ ප්‍රදේශයේ පිහිටි මහවැලි වන රක්ෂිතයට දැනට වසර 05 කට අධික කාලයක සිට අවිධිමත් ලෙස බැහැර කර තිබුණි. ඒ හේතුවෙන් වන අලි තර්ජන හා පාරිසරික ගැටළු මතු වී තිබුණි. | කසළ බැහැර කිරීමට ස්ථානයක් පිළිබඳ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කළ අතර, සුදුසු ස්ථානයක් ලැබුණු වහාම විධිමත් පරිදි කසළ බැහැර කිරීමට කටයුතු කරන බව. | විධිමත් පරිදි කසළ බැහැර කළ යුතුය. |